Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - බුද්ධ ධර්මය

සතිය- 01

ශ්‍රේණිය - 10

Prepared by- ඒ.වී. චමින්ද විජේකුමාර ආරියදාස

# බුදු සිරිතයි - පරිසරය යි

- **කෙටි පිළිතුරු ලියන්න**

1. පරිසරය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
2. බුදුරජාණන් වහන්සේ පළමු වන වස් කාලය ගත කළේ කොහේ ද?
3. බුදුරජාණන් වහන්සේ දහවන වන වස් කාලය ගත කළ ස්ථානය ලියන්න.
4. බුදුරදුන් ස්වාභාවික පරසරය වර්ණනා කළ සූත්‍ර දේශනාවක් නම් කරන්න.
5. බුදුරජාණන් වහන්සේ වේදනා පරිග්‍රහ සූත්‍රය හා සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කළ ස්ථාන නම් කරන්න.
6. උස් හඬින් කථා කරන ප්‍රලාපයන්හි යෙදෙන මිනිසුන් සිටින තැන්වලට වැඩම කිරීම බුදුරදුන් ප්‍රතික්ෂේප කරන බව දැන තම ආශ්‍රමයේ පිරිවැජියන් නිහඬ කළ පිරිවැජියා කවුරුන් ද?

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

1. බුදුරජාණන් වහන්සේ පරිසර පද්ධතිය තුළ සිටින සතුන්ගේ ජීවිත සුරක්ෂිත කළ අවස්ථා දෙකක් ලියන්න.

2. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත් කර ගත් අවස්ථා 5ක් ලියන්න.

3. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය වර්ණනයට ලක් කළ ආකාරය නිදසුන් දෙකකින් දක්වන්න.

4. සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපතේ සිට බුද්ධ පරිනිර්වාණය දක්වා පරිසරය කෙරෙහි හිතානුකම්පී ව කටයුතු කළ සුවිශේෂී අවස්ථා පෙළ ගස්වන්න.

5. ඔබ පරිසරය කෙරෙහි හිතානුකම්පී ව කටයුතු කළ අවස්ථා 5ක් ලියන්න.